පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සිංහල භාෂාව හා සාහිත්‍යය

19.පවෘත්ති.

සිවුවන සතිය

සැකසුම-: හද්රා වික්රමසිංහ

8 ශ්රේණිය

- අප තනිව ජීවත් වන්නන් නොවේ.එනිසා අප අවට වට පිටාව,රට තොට,දේශ දේශාන්තර තොරතුරු,විස්තර දැනගැනීම ස්වභාවයෙන්ම සිදු කරන්නකි.
- ලොව පුරා සිදුවන තොරතුරු 'ප්රවෘත්ති' නමින් හැදින් වේ.
- අතීතයේ ප්රවෘත්ති ඇසූ නමුත්,වර්තමානයේ ප්රවෘත්ති බැලීමට ද හැක.
- පෙර කල ප්රවෘත්ති දැනගන්නා ප්රධාන විද්යුත් ජනමාධ්ය ගුවන් විදුලිය යි.
- ගුවන් විදුලි ප්‍රවෘත්ති ශ්‍රවණය කිරීමෙන් ශ්‍රාවකයාගේ චිත්ත ඒකාග්‍රතාව වර්ධනය වේ, සිසු දරු දැරියන්ගේ මනස දියුණු වේ.
- ගුවන්විදුලි ප්රවෘත්ති එක් වරක් පමණක් ශ්රවණය වනනිසා හොඳින් ග්රහනය කළ යුතුය.
- සිරස්තල හා විස්තර සහිත වශයෙන් ප්‍රවෘත්ති ඉදිරිපත් කරන රටාවක් ඇත.
- දේශීය,විදේශීය,ක්‍රීඩා,කාලගුණ වශයෙන් ප්‍රවෘත්ති විවිධ වර්ගකිරීම් රාශියකි..
- ගුවන් විදුලි ප්‍රවෘත්ති ශ්‍රවණය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.
    1. විකාශන කාල සටහන පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.
    2. කිසිවෙකුටත් හිරිහැරයක්,බාධාවක් නොවන පරිදි සවන් දීමට යොමුවිය යුතුය.
    3. සිරස්තල හා අදාළ විස්තර කෙරෙහි අවධානයෙන් සවන්දිය යුතුය.
    4. ප්‍රවෘත්ති ඉදිරිපත් කරන විලාස අනුව එහි ආකර්ශනීයත්වයත්,තීව්‍රත්වයත් හඳුනාගත යුතුය.
- ඕනෑම අවස්ථාවක වැදගත්ම දේ කුමක්ද,යමක් නිවැරදිව ග්රහනය කරගන්නේ කෙසේද යන්න පිළිබඳ ගුවන් විදුලි ප්රවෘත්ති ශ්රවණයෙන් නිසැකවම දැනුම,අවබෝධය ලැබේ.

පැවරුම්

1. දිනපතා ප්‍රධාන ගුවන් විදුලි ප්‍රවෘත්ති නිවේදනවලට සවන් දී ඒවාහි වැදගත් කරුණු මතකයෙන් ලියන්න.
2. පෙළ පොතේ සඳහන් අභ්‍යාස කරන්න.